# සටහන

2019 – ජනවාරි - මාර්තු 1 - 3 කලාපය



# දත්තවලට කතා කරන්න ඉඩ දෙමු

ISSN 1391-3697
01913
9 770041 001410

රු. 20/


ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# දත්තවලට කතා කරන්න ඉඩ දෙමු

## 1. 2018 වර්ෂයේ දී රුපියලට පහරක්


2018 වර්ෂය ආරම්භයේ දී රුපියල් 153.50ක් පමණ වූ එක්සත් ජනපද ඩොලරයේ අගය 2018 තුන්වන කාර්තුවේ මුල් අවධිය වන විට රුපියල් 161 දක්වා ඉහළ ගිය අතර, ඉන් පසු ව ශීඝ්‍රයෙන් ඉහළ යමින් 2018 නොවැම්බර් වන විට රුපියල් 175කටත් වඩා ඉහළ අගයක ද 2019 ජනවාරි වන විට රුපියල් 180කට වඩා ඉහළ අගයක ද පැවතුණි. රටක විනිමය අනුපාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන්නේ එම රටේ මහ බැංකුව බැවින් මහ බැංකුවේ ඇතැම් මූලික කාර්යයන් පිළිබඳ කතිකාවතක් මේ නිසා නැවතත් කරළියට පැමිණියේ ය.

**2000 වසරේ සිට එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව**
**ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම/අතිප්‍රමාණය වීම**



ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයේ හැසිරීම අධික උච්චාවචනයන්ට ලක්වීම වැළැක්වීම සඳහා 2018 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් විය. කෙසේ වුව ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාර්ව ආර්ථික මූලධර්ම පිළිඹිබු වන පරිදි චලනය වීමට විනිමය අනුපාතිකයට අවකාශ ලබා දෙන ලදි. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ මැදිහත් වීම හේතුවෙන් නිල විදේශීය සංචිත පහළ ගියේ ය. කෙසේ වෙතත්, රජය විසින් ලබා ගත් විදේශීය ණය ප්‍රමාදයකින් තොර ව නැවත ගෙවීමේ වගකීම පෙර පරිදි ම ශ්‍රී ලංකා මහ බැංකුව නිසි ආකාරයෙන් ඉටු කරයි.


**දළ නිල සංචිත**





දත්ත මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017, විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය, 5 වැනි සංඛ්‍යා සටහන, සංචිත, මුළු විදේශීය වත්කම්, විදේශීය ණය සහ විනිමය අනුපාත; සහ සතිපතා ආර්ථික දර්ශක, ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය

ශ්‍රී ලංකා රුපියල ද ඇතුළු ව විවිධ මුදල් ඒකක කිහිපයක ම බාහිර අගය 2018 වසරේ දී සැලකිය යුතු පිරිහීමකට ලක් විය. මෙයට හේතු වූයේ ඇමෙරිකා එක්සත් ජනපද ෆෙඩරල් සංචිත මණ්ඩලය සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සාමාන්‍යකරණය කිරීම නිසා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ මූල්‍ය වාතාවරණය දැඩි වීමයි. 2018 වසරේ දී ශ්‍රී ලංකා රුපියල ද ඇතුළු ව ඇතැම් තෝරා ගත් මුදල් ඒකක කිහිපයක හැසිරීම පහත දැක්වෙන රූපසටහන්වලින් පෙන්නුම් කරයි.


**2018 දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ සහ අනෙකුත් තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවල අතිප්‍රමාණය/අවප්‍රමාණය**



**2018 දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ සහ අනෙකුත් තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවල අතිප්‍රමාණය/අවප්‍රමාණය**




**2018 දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ සහ අනෙකුත් තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවල අතිප්‍රමාණය/අවප්‍රමාණය**





විනිමය අනුපාතික පිළිබඳ දත්ත මූලාශ්‍ර: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වෙබ් අඩවිය

# 2. එහෙත් 2017 දී වාර්තා වූ ඉහළ ම අගය ද පසු කරමින් 2018 දී සෘජු විදෙස් ආයෝජනවල වර්ධනය තවදුරටත්

මේ අතර, විදේශීය අංශයේ සිදු වූ ඇතැම් මෑතකාලීන ප්‍රවණතා ශ්‍රී ලංකා ආර්ථිකයට සුබ නිමිති ගෙන එයි. උදාහරණයක් ලෙස, 2017 හා 2018 වර්ෂවල දී සෘජු විදේශ ආයෝජනවල කැපී පෙනෙන වර්ධනයක් දක්නට විය. මෙම සෘජු විදෙස් ආයෝජන ගලා ඒමෙහි ලා සාර්ව ආර්ථික වාතාවරණය භූමිකාවක් වූ බව නිසැක ව ම සිතිය හැකි යි.

**ශ්‍රී ලංකාවට සෘජු ආයෝජන ගලා ඒම් (ශුද්ධ)**





දත්ත මූලශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017, විශේෂ සංඛ්‍යාලේඛණ පරිශිෂ්ටය, 4 වන සංඛ්‍යා සටහන, ගෙවුම් ශේෂය; සහ ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය


# 3. 2018 වර්ෂයේ දී අපනයන අංශයේ වර්ධනයක්

වෙළෙඳපොළ බලවේග තුළින් ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකය තීරණය වීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවකාශ ලබා දුන් අතර එයින් ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩවල මිල නියම කිරීම තරගකාරී ව සිදු වීමට ඉඩ ලබා දෙයි. මෙය ද මෑත කාලයේ දී අපනයන ආදායමේ වර්ධනයක් වාර්තා වීමට දායක වූ බව නිසැක ව ම කිව හැකියි. ඇතැම් අපනයන උප භාණ්ඩවල ආදායම ඉහළයෑමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබේ.

**මුළු අපනයනය**





**කෘෂිකාර්මික අපනයන**





කෘෂිකාර්මික නිෂ්පාදන අතර ඉහළ ම ආදායම් ජනිත කරන අපනයන භාණ්ඩය ලෙස තේ තවදුරටත් රැඳී සිටියි. එහෙත් අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන කිහිපයක අපනයන ආදායම පසුගිය වසර කිහිපය පුරා ඉහළ යෑමක් දැකිය හැකි යි.


**තේ අපනයන**





**කුළු බඩු අපනයන**




**එළවළු අපනයන**




**මුහුදු ආහාර අපනයන**





**පොල් නිෂ්පාදිත අපනයන**





පසුගිය වසර කිහිපය පුරාවට ම කාර්මික අපනයනවල ක්‍රමික වර්ධනයක් සිදු වී ඇති අතර භාණ්ඩ අපනයන අතරින් ඉහළ ම අපනයන ආදායමක් ඉපැයීමේ මූලාශ්‍රය ලෙස රෙදිපිළි හා ඇඟලුම් අපනයනය අඛණ්ඩ ව පවතී. එහෙත් පසුගිය වසර කිහිපය තුළ දී අනෙකුත් කාර්මික නිෂ්පාදන කිහිපයක අපනයනයේ ද අඛණ්ඩ ඉහළ යෑමක් දක්නට ඇත.


**කාර්මික අපනයන**




## රෙදිපිළි හා ඇඟළුම් අපනයන





## සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන





## රබර් නිෂ්පාදිත අපනයන





## ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන





## ආහාර හා පාන වර්ග අපනයන





## මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන



**යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන**




**දැව සහ කඩදාසි නිෂ්පාදිත අපනයන**





අපනයන දත්ත මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය


## 4. යහපත් ආනයන කළමනාකරණය සඳහා අපේ ප්‍රතිපත්ති මගින් සහයක්

ආනයනය ගත් විට, පහත සඳහන් රූප සටහන්වලින් දැකිය හැකි වන පරිදි අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩ මෙන් ම පාරිභෝගික භාණ්ඩ ලෙස වර්ගීකරණය කරන ලද ඇතැම් අත්‍යවශ්‍ය අයිතම ආනයනය අස්ථාවර කිරීමකින් තොර ව මෑතක දී මහ බැංකුව විසින් ගනු ලැබූ ආනයනය කෙරෙහි බලපාන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වනු ඇතැ යි දැනට පවතින දත්ත අඟවයි. මෙ සේ ගනු ලැබූ එක් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යක් වන්නේ 2018 සැප්තැම්බර් අග සිට 2019 මාර්තු මුල දක්වා බල පැවැත්වෙන පරිදි සාමාන්‍යයෙන් වාණිජ නො වන කටයුතු සඳහා භාවිතයට ගනු ලබන රථවාහන ආනයනය සඳහා නියාමන පැනවීමයි.


**රථවාහන හැර අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වියදම්**




### වාහන ආනයනය සඳහා වියදම්





### බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයනය සඳහා වියදම්





## ඉන්ධන හැර අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයනය සඳහා වියදම්





## ඉන්ධන ආනයනය සඳහා වියදම්




## ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා වියදම්





## ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය සඳහා වියදම්




## යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය සඳහා වියදම්




## ප්‍රවාහන උපකරණ ආනයනය සඳහා වියදම්





ආනයන දත්ත මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය

# 5. ණය ප්‍රවාහයන් සතුටුදායක මට්ටමක පැවතීම ආර්ථික කටයුතුවලට ශක්තියක්


ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කළ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අනුව බිහි වූ සාර්ව ආර්ථික ප්‍රතිඵල සැලකීමේ දී පසුගිය වසර කිහිපය තුළ බැංකු ක්ෂේත්‍රයේ ණය ප්‍රවාහයන්හි සහ අක්‍රීය ණයෙහි හැසිරීමෙන් පෙනෙන්නේ කෘෂිකාර්මික හා කාර්මික අංශයන්හි ආර්ථික කටයුතු සතුටුදායක මට්ටමක පවතින බවයි. මේ හේතුව නිසා ම පෞද්ගලික ණය හා අත්තිකාරම් ලෙස බැංකු විසින් සපයා ඇති ණය ද සතුටුදායක මට්ටමක පවතියි.

**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණය හා අත්තිකාරම්**




දත්ත මූලාශ්‍රය: පෞද්ගලික අංශයට වාණිජ බැංකු දෙන ලද ණය හා අත්තිකාරම්, මාසික විවරණිකාව, ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය


**පෞද්ගලික අංශයේ ණය වර්ධනය සහ අක්‍රීය ණය**




දත්ත මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය

පහත දැක්වෙන රූප සටහනේ දැකිය හැකි පරිදි ණය ප්‍රවාහයන් සහ අක්‍රිය ණය මගින් පිළිබිඹු වන ආර්ථික කටයුතු වල ප්‍රවණතාවන් විදුලිය විකිණුම් (ආර්ථික කටයුතු, එ නම් දළ දේශීය නිෂ්පාදිතයේ හැසිරීම නිරීක්ෂණය කිරීමට සුලබ ව භාවිත කරන විචල්‍යයක්) හි ප්‍රවණතාවන් මගින් තහවුරු කරයි.


**විදුලිය විකුණුම් (ගිගාවොට් පැය)**
**වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%)**





දත්ත මූලාශ්‍රය: වාර්ෂික වාර්තා සහ මාසික ආර්ථික දර්ශක, ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය

මේ අතර, 2018 සැප්තැම්බර් මාසයට පෞද්ගලික අංශය ලබාගත් ණය ප්‍රමාණය එයට වසර පහකට පෙර තත්ත්වයට එනම් 2013 සැප්තැම්බර් මාසයට සන්සන්දනය කර බැලීමේ දී කාර්මික අංශයට ලබා දුන් ණය ප්‍රමාණයේ සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්වන අතර සේවා අංශයට ලබා දුන් ණය ප්‍රමාණයේ වර්ධනයක් ද දැකිය හැකි යි. කාර්මික අංශය තුල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ණය ප්‍රමාණය මෙම කාල සීමාව තුළ ඉහළ ගොස් ඇත.


**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට**
**දෙන ලද ණය හා අත්තිකාරම් - 2013 සැප්තැම්බර් මාසයට**





**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට**
**දෙන ලද ණය හා අත්තිකාරම් - 2018 සැප්තැම්බර් මාසයට**




**වාණිජ බැංකු විසින් සපයන ලද
පෞද්ගලික ණය හා අත්තිකාරම් - 2013 සැප්තැම්බර් මාසයට**





**වාණිජ බැංකු විසින් සපයන ලද
පෞද්ගලික ණය හා අත්තිකාරම් - 2018 සැප්තැම්බර් මාසයට**





**වාණිජ බැංකු විසින් සේවා අංශයට
සපයන ලද ණය හා අත්තිකාරම් - 2013 සැප්තැම්බර් මාසයට**





**වාණිජ බැංකු විසින් සේවා අංශයට
සපයන ලද ණය හා අත්තිකාරම් - 2018 සැප්තැම්බර් මාසයට**





**වාණිජ බැංකු විසින් කෘෂිකාර්මික අංශයට
දෙන ලද ණය හා අත්තිකාරම් - 2013 සැප්තැම්බර් මාසයට**





**වාණිජ බැංකු විසින් කෘෂිකාර්මික අංශයට
දෙන ලද ණය හා අත්තිකාරම් - 2018 සැප්තැම්බර් මාසයට**



**වාණිජ බැංකු විසින් කර්මාන්ත අංශයට සපයන ලද ණය හා අත්තිකාරම් - 2013 සැප්තැම්බර් මාසයට**




**වාණිජ බැංකු විසින් කර්මාන්ත අංශයට සපයන ලද ණය හා අත්තිකාරම් - 2018 සැප්තැම්බර් මාසයට**





දත්ත මූලාශ්‍රය: වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම්, මාසික විවරණිකාව, ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය

# 6. එහෙත් අභියෝගාත්මක ගෝලීය ආර්ථික තත්ත්ව පිළිබඳ ව අවදියෙන් සිටීම වැදගත්

මහ බැංකුව එහි මිල ස්ථායීතා අරමුණ ළඟා කර ගැනීම සඳහා හසුරුවනු ලබන වෙළෙඳපොළ පොලී අනුපාතික සැලකීමේ දී, පසුගිය වකවානු කිහිපයක දී ම දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තත්ත්ව නිසා වෙළෙඳපොළ පොලී අනුපාතිකවල ඉහළ යෑමක් සිදු විය. ආර්ථික කටයුතු සඳහා යහපත් වාතාවරණයක් ඇති කිරීම උදෙසා මහ බැංකුව විසින් මෙම අවස්ථා පාලනය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වාණිජ බැංකුවල සමස්ත ණය කළඹට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම පෙන්නුම් කරන සාමාන්‍ය බරිත ණය අනුපාතය පසුගිය වසර කිහිපයේ දී සියයට 15කට වඩා අඩු මට්ටමක රැඳී පැවතුණි.


**දේශීය පොලී අනුපාතික**





දත්ත මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංවර්ධනය වූ ආර්ථිකයන් වඩාත් ශක්තිමත් වීමත් සමඟ ම 2018 වසර තුළ දී ගෝලීය මූල්‍ය තත්ත්වයන් ක්‍රමයෙන් දැඩි විය. තම මුදල් ප්‍රතිපත්තිය සාමාන්‍යකරණය කිරීමට එම රටවල මහ බැංකු විසින් ගන්නා ලද පියවර හේතුවෙන් නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් හා සංවර්ධන වෙමින් පවතින රටවල මූල්‍ය තත්ත්වයන් මත පීඩනයක් ඇති විය. කෙසේ වෙතත්, මෑතක දී ගෝලීය ආර්ථික කටයුතු මන්දගාමී වීම සහ ලෝකය මුහුණ දෙන භූ දේශපාලනික ගැටලු කරළියට පැමිණ ඇත. එ බැවින් එ වැනි ගෝලීය ව දිගින් දිගට ම වෙනස් වන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව තම ප්‍රතිපත්ති නිරන්තරයෙන් ම යාවත්කාලීන කළ යුතු ව ඇත.


**තෝරාගත් පෙරදිග හා අග්නිදිග ආසියානු රටවල් කිහිපයක් - ප්‍රතිපත්ති පොලී අනුපාතික**




**තෝරාගත් සංවර්ධිත ආර්ථික කිහිපයක් - ප්‍රතිපත්ති පොලී අනුපාතික**




**තෝරාගත් දකුණු ආසියානු රටවල් කිහිපයක් - ප්‍රතිපත්ති පොලී අනුපාතික**




දත්ත මූලාශ්‍රය: මහ බැංකු වෙබ් අඩවිය

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.